# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

### 2024 අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

### දේශපාලන විද්‍යාව

### දේශපාලන චින්තනය - POLS 28224

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඇරිස්ටෝටල්ගේ දේශපාලන චින්තනයේ ඇතුළත් මූලික ඉගැන්වීම් පැහැදිලි කර, දේශපාලන න්‍යායේ වර්ධනයට ඔහුගෙන් ලැබුණු දායකත්වය අගය කරන්න. (ලකුණු 20)

02. මැකියාවෙලිගේ දේශපාලන චින්තනයේ "ආචාර ධර්ම සහ දේශපාලනය එකිනෙකින් ඈත් කිරීම" පිළිබඳව විමර්ශනයක් කරන්න. (ලකුණු 20)

03. "ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල එකම පුද්ගලයා තුළ හෝ එකම බලධාරී මණ්ඩලයක් තුළ හෝ එක් වූ විට එහි නිදහසක් තිබිය නොහැකිය." මෙම කියමනේ වලංගුතාවය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

04. මාක්ස්වාදයේ මූලිකාංග කෙටියෙන් විස්තර කර, සමාජවාදී විප්ලවය සහ කොමියුනිස්ට් සමාජය පිළිබඳව මාක්ස්ගේ අදහස්වල ප්‍රායෝගිකභාවය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

05. සම්භාව්‍ය ලිබරල්වාදය සහ නව ලිබරල්වාදය අතර පවතින වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. 
    1. බෞද්ධ දේශපාලන චින්තනය තුළ සඳහන් රාෂ්ට්‍ර පාලන ධර්ම පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)
    11. ඉහත සඳහන් රාෂ්ට්‍ර පාලන ධර්මවල ඇති සදාචාරාත්මක වැදගත්කම අගය කරන්න. (ලකුණු 10)

07. ජවහර්ලාල් නේරු චින්තනයේ පදනම වූයේ "ලෞකිකත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය යන මූලධර්මයි." උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 10 බැගින් හිමි වේ.)
    - i. අධ්‍යාපනය පිළිබඳව ප්ලේටෝගේ මතය
    - ii. ස්ටොයික්වාදය (Stoicism)
    - iii. ශාන්ත ඔගස්ටීන්ගේ 'දෙවියන්ගේ නගරය" (City of God)
    - iv. ජීන් බොඩෑන්ගේ "ස්වාධිපත්‍යය සංකල්පය"
    - v. කෞටිල්‍යගේ "අර්ථශාස්ත්‍රය"

**********************************